ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ශ්‍රී ලංකාව තුළ ඉහළ බලපෑමක් සහිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා තවත් වසර පහකට ප්‍රදාන ලබා දීමට ඉන්දියාව එකඟ වේ</u>

ඉන්දිය ප්‍රදාන හරහා ශ්‍රී ලංකාවේ ඉහළ බලපෑමක් සහිත සංවර්ධන ව්‍යාපෘතීන් (HICDP) අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුම මහ කොමසාරිස්තුමා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා විසින් 2025 නොවැම්බර් 11 වන දින අත්සන් කර හුවමාරු කර ගන්නා ලදී. මේ අනුව දැනට පවත්නා රාමුව තවත් වසර 5ක් සඳහා දීර්ඝ කරන ලදී.

2. ශ්‍රී ලංකා රජයේ සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක වන සාපේක්ෂව කුඩා නමුත් ඉහළ බලපෑමක් සහිත සංවර්ධන මූලපිරීම් හරහා ශ්‍රී ලංකාවේ සංවර්ධන අභිලාෂයන් සහ අවශ්‍යතාවයන්ට සහය දැක්වීමේ අරමුණින් HICDP රාමුව සකස් කර ඇත. මේ යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘතීන් විශාල සහ මධ්‍යම පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් සහ විශේෂ මූල්‍ය සහය පැකේජ සඳහා අරමුදල් සපයන අතරම ක්‍රියාත්මක කරනු ලැබේ. HICDP රාමුව යටතේ ආවරණය කෙරෙන ව්‍යාපෘතියක උපරිම ප්‍රාග්ධන පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක් වන අතර යම් අවස්ථාවක ක්‍රියාත්මක කරනු ලබන එවැනි සියලුම ව්‍යාපෘතිවල සමස්ත උපරිම ප්‍රාග්ධන පිරිවැය ශ්‍රී ලංකා රුපියල් බිලියන 10ක් වේ. ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා ජනතාවගේ අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා මත පදනම් වේ.

3. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් එවැනි රාමුවක් වසර 5ක් සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට 2005 ජූනි මාසයේදී පළමු වරට එළඹෙන ලදී. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා මහත් සේ දායක වී තිබීම සහ ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම සැලකිල්ලට ගෙන මෙම රාමුව 2010, 2015 සහ 2020 වසරවලදී ද දීර්ඝ කරන ලදී. නොවැම්බර් 11 වන දින අවබෝධතා ගිවිසුම දීර්ඝ කරන ලද්දේ සිව්වන වරටය.

4. මේ වන විට ඉන්දිය ප්‍රදාන යටතේ ඉහළ බලපෑමක් සහිත සංවර්ධන ව්‍යාපෘතීන් 50කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත. මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා නව ශල්‍ය ඒකකයක් ඉදිකිරීම, අනුරාධපුරයේ පූජ්‍ය සෝභිත

නාහිමිගම ගම්මානයේ නිවාස 115ක් සහ යටිතල පහසුකම් ඉදිකිරීම, මාතලේ ඉදි කළ මහත්මා ගාන්ධි ප්‍රජා මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාව පුරා පිහිටි අධ්‍යාපන ආයතන සඳහා බස් රථ 110ක් සැපයීම, යාපනය දුරයියප්පා ක්‍රීඩාංගනය නවීකරණය කිරීම, තේ වතුවල වැඩ කරන මව්වරුන්ගේ පහසුව පිණිස වතුකර ප්‍රදේශවල දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු සහ කෘෂි පීඨ සහ කිළිනොච්චි මණ්ඩපය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ශ්‍රී දළදා මාලිගාව යටතේ පවතින උඩරට නර්තන ඇකඩමිය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ රුහුණ විශ්ව විද්‍යාලයේ ඉදිකරන ලද රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය යනාදිය එවන් ව්‍යාපෘතීන් අතර වේ.

5. ශ්‍රී ලංකා රුපියල් බිලියන 7කට අධික ප්‍රදාන යටතේ ඉහළ බලපෑමක් සහිත සංවර්ධන ව්‍යාපෘතීන් 21ක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුළම නිවාස 24කින් සමන්විත ආදර්ශ ගම්මානය බැගින් ඉදිකිරීම, දකුණු පළාතේ පාසල් 200ක් සඳහා සුහුරු පන්ති කාමර සහ පරිගණක විද්‍යාගාර ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථානවල භාවිතය සඳහා සිංගල් කැබ් රථ ලබා දීම යනාදිය මේ අතර වේ. වතුකර ප්‍රදේශවල තෝරාගත් පාසල් සඳහා සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපිත කිරීම, කරයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම සහ මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර අංශය ඉදිකිරීම සහ ඒ සඳහා වෛද්‍ය උපකරණ සැපයීම යනාදිය වඩාත්ම මෑතකදී, මෙම යෝජනාක්‍රමය යටතේ ඉන්දියාව විසින් එකඟ වූ ව්‍යාපෘතීන් වේ.

***

***කොළඹ***
***2025 නොවැම්බර් 11***